# ඉන්දියාවේ ශ්‍රී ලංකා දූත මණ්ඩල රාෂ්ට්‍ර ක්‍රමෝපාය වාර්තාව මහා සංඝරත්නයට



මිලින්ද මොරගොඩ මහතා ඉන්දියාවේ මහ කොමසාරිස්වරයා වශයෙන් නම් කර ඇති අතර 2021-23 ඔහුගේ ධූර කාලය තුළ ඉන්දීය, ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා වූ ඒකාබද්ධ රාෂ්ට්‍ර ක්‍රමෝපායයක් සකස් කර තිබේ. බුදුරජාණන් වහන්සේ සූත්‍ර පිටකයේ, අංගුත්තර නිකායේ, ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දේශනා කරන ලද සද්ධා, සීල, ත්‍යාග, සහ පඤ්ඤා යන සතර සම්පදා මෙම ප්‍රකාශනයට පදනම් කරගෙන ඇත.

නීල කාලය තුළ ඉන්දු ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සඳහා පදනම් කරගන්නා මෙකී ප්‍රකාශනයේ ඉංග්‍රීසි හා සිංහල පිටපත් ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ උත්තරීතර මහා නායක මකුලෑවේ විමල, ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක දොඩම්පහල චන්ද්‍රසිරි, සහ කැලණිය රජමහා විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත යන නාහිමිපාණන් වෙත පිරිනමන ලද අවස්ථා මෙහි දැක්වෙයි.